ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

පළමු සමාසික අවසාන පරීක්ෂණය 2009

නිර්මාණාත්මක සහ සෞන්දර්ය අධ්‍යාපනය හා හසුරු
කුසලතා සංවර්ධනය - ESC 1124/ESC1135

කාලය - පැය දෙකයි.

---

දිනය - 2009.07.05 වේලාව - පෙ.ව. 10.00- මධ්‍යාහ්න 12.00 දක්වා

---

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

එක් එක් කොටස සඳහා පිළිතුරු වෙන වෙනම පොත්වල ලියන්න. ඒ සඳහා ඔබට පොත් තුනක් ලැබෙනු ඇත.

## පළමුවන කොටස

01. i. හසුරු කුසලතා යන්නෙන් අදහස් වන්නේ කුමක් දැයි පෙන්වා දෙන්න.
(ලකුණු 05)

ii. ළමයින් තුළ හසුරු කුසලතා සංවර්ධනය කිරීමේදී පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඔබ භාවිත කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

අ) ජලය වක්කිරීම
ආ) ඇඹීම
ඇ) ලණු පැනීම හා උස පැනීම
ඈ) කැබලි මගින් නිර්මාණ ගොඩ නැඟීම
(ලකුණු 20)

02. i. පෙර පාසල් සෞන්දර්ය අධ්‍යාපනයේ සුවිශේෂ අරමුණු පහක් ලියන්න.
(ලකුණු 05)

ii. ඉන් අරමුණු 2 ක් ඉටුකර ගැනීම සඳහා අවුරුදු 4-5 සිසුන් සඳහා කළ හැකි ක්‍රියාකාරකමක් දක්වන්න.
(ලකුණු 10)

iii. එම ක්‍රියාකාරකම සඳහා ප්‍රයෝජනයට ගන්නා උපකරණ ලැයිස්තුවක් ලියා ඒවා යොදා ගන්නා අයුරු පැහැදිලි කරන්න.
(ලකුණු 10)

## දෙවන කොටස

03. i. පෙර පාසල් ළමයින් සඳහා කතාන්දරයක් නිර්මාණය කිරීමේ දී ඔබ අනුගමනය කළයුතු මූලධර්ම 4 ක් පෙන්වා දෙන්න.

(ලකුණු 12)

ii. එම මූලධර්ම මතුකර පෙන්වීමට කතාන්දරයක් ගොඩනගන්න.

(ලකුණු 13)

04. දරුවන්ගේ පූර්ණ සංවර්ධනය සඳහා සංගීතය හා චලනය යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 25)

## තෙවන කොටස

05. වැලි, වතුර, හා මැටි උපයෝගී කරගෙන කෙරෙන ක්‍රියාකාරකම් පෙර පාසල් ළමයින් ගේ කියවීමේ හා ලිවීමේ කුසලතා සංවර්ධනයට කෙසේ උපකාරී වන්නේ දැයි පෙන්වා දෙන්න.

(ලකුණු 25)

06. පෙර පාසල් ළමයින්ට චිත්‍ර හා නිර්මාණාත්මක හැකියා සංවර්ධනය කර ගැනීම සඳහා ගුරුවරියට සහය විය හැකි ආකාර නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 25)

\- හිමිකම් ඇවිරිණි. -